
# මහින්දට සියලු පක්ෂ සහය



*ජාත්‍යන්තර ප්‍රජාව අතර වාසි ලබා ගැනීමේ අරමුණෙන් යුතුව කොපමණ ආවේගකාරී තත්ත්වයන් හා ප්‍රචණ්ඩ ක්‍රියා කිරීමට එල්.ටී.ටී.ඊ. සංවිධානය උත්සාහ කළ ද අඩන්නට සිටින බබාගේ ඇසට ඇඟිල්ලෙන් අනින්නාක් මෙන් ඒ සඳහා ඉඩ ප්‍රස්තා සලසා නොදෙමින් කටයුතු කිරීම දකුණේ දේශපාලන පක්ෂවලත් ප්‍රජාවගේත්, වගකීමකි.*

යුද හමුදාපති ලුතිනන් ජෙනරාල් සරත් ෆොන්සේකා මහතාට පසුගිය අප්‍රියල් 25 වන දා යුධ හමුදා මූලස්ථාන භූමිය තුළදී එල්ල කළ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරය මෙරට දේශපාලන දේහය පමණක් නොව මුළු ලොවම සලිත කළ සිදුවීමක් බවට පත්ව ඇත. යුද හමුදාපතිවරයාට එම ප්‍රහාරය එල්ල වූ දිනම පස්වරුවේ ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා එක්සත් ජනතා නිදහස් සන්ධාන රජයට අයත් දේශපාලන පක්ෂ නායකයිනුත්, සන්ධානයට සහය දක්වන ජනතා විමුක්ති පෙරමුණ සහ ජාතික හෙළ උරුමය වැනි පක්ෂවල නායකයින් මෙන්ම මෙරට ප්‍රධාන විරුද්ධ පක්ෂය වන එක්සත් ජාතික පක්ෂයේ නායකයින්වත් අරලියගහ මන්දිරයට කැඳවා රටේ ඉදිරි කටයුතු සම්බන්ධයෙන් කළ සාකච්ඡාවන්ගෙන්ද එම ප්‍රහාරයේ පවත්නා බරපතලකම ඔවුන් තේරුම් ගත් සෙයකි. ජනාධිපතිවරයා සහ දේශපාලන පක්ෂ නායකයින් අතර පැවති එම සාකච්ඡාවන්හිදී රටේ ජාතික ප්‍රශ්න සම්බන්ධයෙන් මෙන්ම මෙවන් අවස්ථාවලදී පොදු එකඟතාවයක් ඇතිව කටයුතු කිරීමට තිබෙන අවශ්‍යතාවය එහිදී අවධානය ගෙන ඇති අතර එවන් එකඟතාවයක් සහිතව කටයුතු කිරීමට තිබෙන අවශ්‍යතාවය සියළුම දේශපාලන පක්ෂ විසින්ද පිළිගෙන ඇත. රජය සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය අතර දෙවන සාකච්ඡා වටය සඳහා කටයුතු සුදානම් වෙමින් තිබියදී සටන් විරාම ගිවිසුම දැඩිව උල්ලංඝනය කරමින් හමුදාපතිවරයාට එල්ල කළ ප්‍රහාරය සම්බන්ධයෙන් නිහඬ නොවූ ඇමරිකනා එක්සත් ජනපදය යුරෝපා සංගමයේ රටවල් ඇතුළු ජාත්‍යන්තර ප්‍රජාව එම එල්.ටී.ටී.ඊ. ප්‍රහාරය දැඩිව හෙළි දකින්නෙන් එම සංවිධානයට අනතුරු අඟවා සිටියේය. එපමණකින් නොනැවතුණු ජාත්‍යන්තර ප්‍රජාව එල්.ටී.ටී.ඊ. සංවිධානය තවදුරටත් මෙලෙස සටන් විරාම ගිවිසුම උල්ලංඝනය කරමින් කටයුතු කරන්නේ නම් එහි අහිත කර ප්‍රතිඵලවලට මුහුණදීමට සිදුවන බවද ඔවුහු අනතුරු ඇඟවූහ. යුද හමුදාපතිවරයාට එල්ල කළ මරාගෙන මැරෙන එල්.ටී.ටී.ඊ. ප්‍රහාරයත් සමඟ රට තුළ උද්ගත වූ තත්ත්වය සහ තවදුරටත් ජාතික ප්‍රශ්නය සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව සාකච්ඡා කර එකඟතාවයක් ඇති කර ගැනීම සඳහා ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා විසින් පසුගිය අප්‍රියෙල් 28 දා විශේෂ සර්ව පාර්ශික සමුළුවක් ජනාධිපති ලේකම් කාර්යාලයට කැඳවූවේය. තවදුරටත් එල්.ටී.ටී.ඊ. සංවිධානය සහ සාම ක්‍රියාවලිය සම්බන්ධයෙන් කටයුතු කළයුතු ආකාරය පිළිබඳව ජනතා විමුක්ති පෙරමුණ මෙන්ම ජාතික හෙළ උරුමය තරමක වෙනස් ස්වරයක සිටිමින් අදහස් දැක්වූවද රජය තවදුරටත් එල්.ටී.ටී.ඊ. සංවිධානය සමඟ සාකච්ඡා මාර්ගයෙන් දේශපාලන විසඳුමක් සොයා ගැනීම සඳහා කටයුතු කළයුතු බවට එම පක්ෂ දෙකේද ස්ථාවරය විය. එම සමුළුවට සහභාගි වූ සියළු පක්ෂවල සහාය ඇතිව එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ප්‍රචණ්ඩ ක්‍රියා නතර කිරීම සඳහා එම සංවිධානයට බලපෑම් කරන ලෙස ජාත්‍යන්තර ප්‍රජාවගෙන් ඉල්ලා සිටිය යුතු බවටත් තවදුරටත් සාකච්ඡා මාර්ගයෙන් දේශපාලන විසඳුමක් ලබා ගැනීම සඳහා කටයුතු කළයුතු බවටත් සඳහන් ප්‍රකාශයක් නිකුත් කිරීමටද ඔවුහු එකඟ වූහ. අනතුරුව සර්ව පාක්ෂික සමුළුව අවසන් වූයේ ඒ සඳහා වන ප්‍රකාශනයට ආණ්ඩුව නියෝජනය කරන දේශපාලන පක්ෂ ඇතුළු පාර්ලිමේන්තුව නියෝජනය කරන සියළු දේශපාලන පක්ෂ එකඟ වූ ලියවිල්ලට සියළු නායකයින් විසින් අත්සන් තබා ප්‍රකාශයට පත් කිරීමත් සමඟය. අප රටේ දේශපාලන පක්ෂ කටයුතු කරන ආකාරය දෙස බැලූ කළ එය රට පිළිබඳව සිතා කටයුතු කළ සාධරනීය අවස්ථාවක් ලෙස සැලකිය හැකිය. මක්ද වෙනත් බොහෝ අවස්ථාවලදී ජාතික වැදගත් කමකින් යුතු කාරණා සම්බන්ධයෙන් එකඟතාවයක් සකසා ගැනීම සඳහා කොපමණ සාකච්ඡා කළද ඇලපිල්ලේ පාපිල්ලේ ප්‍රශ්න මත එම එකඟතා ගොඩනගා ගත නොහැකිව අසාර්ථක වේ. එසේත් නැතිනම් යම් තරමකට හෝ ඇති වෙමින් තිබූ එකඟතා සාර්ථක කර ගත නොහැකිව එවන් ප්‍රශ්නමත බිඳ වැටෙන අයුරු අප ඕනෑ තරම් දැක ඇත. නමුත් පරස්පරයන් තිබුණද මෙවර එසේ නොවන්නට අපගේ දේශපාලන නායකයින් වගබලා ගෙන ඇති බව පෙනීයයි. එය සුබ ලකුණින් එසේ වුවද එහි ගෞරවය හිමිවන්නේ දේශපාලන නායකයින-"ටම නොවන බවත් පැහැදිලිය. එය දේශපාලනඥයින් සමාජ අවශ්‍යතාවයේ මෙන්ම රට තුලින් එන බලපෑමට ඇහුම්කන්දී තත්ත්වය තේරුම් ගෙන කටයුතු කළ අවස්ථාවක් වන්නේය.

දේශීය වශයෙන් දෙමළ ජනතාව තුළත්, ජාත්‍යන්තර වශයෙන් දෙමළ ජනතාවගේ මෙන්ම ජාත්‍යන්තර ප්‍රජාව අතර වාසි ලබා ගැනීමේ අරමුණෙන් යුතුව කොපමණ ආවේගකාරී තත්ත්වයන් හා ප්‍රචණ්ඩ ක්‍රියා කිරීමට එල්.ටී.ටී.ඊ. සංවිධානය උත්සාහ කළ ද අඩන්නට සිටින බබාගේ ඇසට ඇඟිල්ලෙන් අනින්නාක් මෙන් ඒ සඳහා ඉඩ ප්‍රස්තා සලසා නොදෙමින් කටයුතු කිරීම දකුණේ දේශපාලන පක්ෂවලත් ප්‍රජාවගේත්, වගකීමකි. දකුණේ දේශපාලන අවුල්සහගත තත්ත්වයක් ඇති කිරීමෙන් හටගන්නා අරාජතත්ත්වයත් ආවේගකාරීත්වයෙන් හා ප්‍රපෝක කිරීම්වලින් ඇති වන ජාතිවාදයත් සේවය සලසන්නේ එල්.ටී.ටී.ඊ. සංවිධානයටය. මීට පෙර යම් අවස්ථාවලදී අප රට තුළ හටගත් එවන් ආකාරයේ තත්ත්වයන් නිර්වින්ද වීමට ඉඩ නොතැබීමේ වගකීම පැවරෙන්නේද ආණ්ඩුව ඇතුළු දකුණේ දේශපාලන පක්ෂවලට හා ව්‍යාපාරවලටය. මේ වනවිට ඔවුන් එය තේරුම් ගෙන කටයුතු කරන සෙයක් පෙනීයයි. තවදුරටත් එම තත්ත්වය රැකගත යුතුව ඇති අතර පවත්නා තත්ත්වය තුළ යම් පිරිසකට එලෙස මතුවීමට යම් ඉඩක් ඇත්නම් එම ඉඩ ප්‍රස්ථා අහුරා දැමීමද ඔවුන්ගේ වගකීමකි.

එමගින් රටේ ජාතික ආරක්ෂාව දුර්වලවීමේ හැකියාවක් නොමැත. රජයත් ජාතික ආරක්ෂාව සඳහා පියවර ගත යුතුය. ජාතික ආරක්ෂාව දැඩි කිරීම සඳහා ගන්නා පියවරයන් සාමාන්‍ය දෙමළ සිවිල් ජනතාව පීඩාවට පත් කරන, ඔවුන්ව එල්.ටී.ටී.ඊ. තුරුලට තල්ලු වන ආකාරයේ පියවරයන් බවට පත්වීමට තිබෙන ඉඩකඩ වලක්වා ගැනීමද රජයේ වගකීමකි. රජය පියවර ගත යුතුව ඇත්තේ ප්‍රවේසම් සහගතවය. එමෙන්ම දෙමළ ජනතාව දිනා ගැනීමේ ක්‍රමවේදයක්ද සහිතවය.
දකුණේ දේශපාලන පක්ෂ අතර ජාතික වැදගත්කමකින් යුතු ප්‍රශ්න සම්බන්ධයෙන් මෙතෙක් ඇතිකර ගෙන තිබෙන එකඟතාවයන්ගේ තරම පිළිබඳව කිසිවෙකුටවත් සෑහීමකට පත්විය හැකියයි කිව නොහැක. මන්ද එම එකඟතාවයන්ට සෑම අවස්ථාවකදීම වැඩි ආයු කාලයක් පැවතියේ නැත. මෑතකදී පැවති ආසන්නම අත්දැකීම වන්නේ සුනාමී ව්‍යසනය අවස්ථාවේදී පාර්ලිමේන්තුව නියෝජනය කරන දේශපාලන පක්ෂ අතර ඇති කරගත් එකඟතාවයයි. එය අප රටේ ඉතිහාසයේ විශාලතම ස්වභාවික ඛේදවාචකයට ලක්වූ අවස්ථාවද වේ. තුන් මාසය ගතවෙද්දී සියල්ලෝ එක්ව පහන් දැල්ලුවෝය. මළගිය වුන් සිහි කළහ. එක්ව රට නගා සිටුවිය යුතු බව පැවසූහ. එහෙත් සුනාමි මහා ඛේදවාචකයට වසරක් සම්පූර්ණ වූ අවස්ථාව සමරණ විට එහි සිටියේ ආණ්ඩු පක්ෂ නියෝජිතයින් පමණය. එසේ වීමට ආසන්නතම හේතු විය හැක්කේ ඒ වනවිට උද්ගතව තිබූ වෙනත් දේශපාලන කාරණා මත විපක්ෂයේ නියෝජිතයින් ආණ්ඩුවේ කටයුතු වලින් ඈත්ව සිටීමය. එසේ නොමැතිනම් දේශපාලන හේතූන් මත ආණ්ඩු පක්ෂය විපක්ෂය නොතකා හැර කටයුතු කිරීම නිසාය. කවර දේශපාලනයක් කළද ජාතික වැදගත්කමකින් යුතු ප්‍රශ්නවලදී එක්ව, සාමූහිකව, අහංකාරකම් ඉවතලා කටයුතු කිරීමේ හැකියාව අපගේ දේශපාලන පක්ෂවලට හා එම පක්ෂ නායකයින්ට තිබිය යුතුය. එසේ නොවුවහොත් ඔවුන් දැනුවත්ව හෝ නොදැනුවත්ව යම් වරදකට දායකවන්නේ ද වෙති. ඒ අවස්ථාවලදී බලයේ සිටින්නේ කවර දේශපාලන පක්ෂය ද යන්නට වඩා රටට වැදගත් වන්නේ රටේ සහ ජනතාවගේ අනාගතය වෙනුවෙන් එකඟතාවයකින් කටයුතු කිරීමට සුදානම් වන්නේද? එම එකඟතාවයන් ඇති කර ගන්නේ කවර කාරණයන් සඳහා ද යන්න පිළිබඳව පමණකි.

**කාශ්‍යප මල්ලවාරච්චි**

